පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය
த. பெ .இல.
P. O. Box No. 517

ෆැක්ස්
தொலைநகல்
Fax No. 011- 2329500

දුරකථනය
தொலைபேசி
Telephone 011-2384024
011-2395605

Website: www.police.lk

ඊ - මේල්
மின்-அஞ்சல்
E-Mail Policemedia@police.lk

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

**2020.03.10 පැය 0545**
**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කර්තෘ,**
**මහත්මයාණනි / මහත්මියණි,**

## හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස ක්ෂණික ප්‍රතිචාර ඒකකය

01. 2020.03.09 වන දින සවස 6.30 ට පමණ ගල්කිස්ස හන්දිය අසලදී ගල්කිස්ස කොට්ඨාස ක්ෂණික ප්‍රතිචාර ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 02 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42ක් වූ විහාර පාර, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** සැකකරු 2020.03.10 වන අද දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## මනුෂ්‍ය ඝාතනයක් - මීගමුව

02. 2020.03.09 වන දින රාත්‍රී 9.30 ට පමණ මීගමුව පොලිස් වසමේ පෙරියමුල්ල ප්‍රදේශයේදී පිහිටි හෝටලයකට පැමිණි 06 දෙනෙකුගෙන් යුත් පිරිසක් විසින් එම හෝටලය තුළ මත්පැන් පානය කිරීමට උත්සාහ කිරීමේදී හෝටල් හිමිකරු සහ සේවකයන් එයට විරුද්ධ වී ඇත. පසුව පැමිණි පිරිස හෝටල් හිමිකරු හා සේවකයන් සමඟ ආරවුලක් ඇති කරගෙන ඇත. ආරවුල අතරතුර එම පිරිස විසින් හෝටල් හිමිකරුට හා සේවකයන්ට තියුණු ආයුධයකින් පහරදී පළා ගොස් ඇත. පහරකෑමට ලක්වූ වෙළඳසැල් හිමිකරු ඇතුළු සේවකයන් සිවු දෙනෙකු බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා මීගමුව රෝහලට ඇතුලත් කිරීමේදී එක් සේවකයකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ ගනේවැල්පොල, කැකිරාව ලිපිනයේ පදිංචිකරුවෙකි.** මෙම අපරාධය සිදු කළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## වන අලි ප්‍රහාරයකින් කාන්තාවක් මියයාමක් - මැදවච්චිය

03. 2020.03.09 වන දින උදෑසන 10.30 ට පමණ මැදවච්චිය පොලිස් වසමේ තුලාවෙල්ලිය ප්‍රදේශයේදී රනවරා මල් කැඩීම සඳහා කැලයට ගොස් සිටි අවු සැමි යුවලකගෙන් කාන්තාව වන අලි ප්‍රහාරයකට ලක්ව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 55ක් වූ මැදගම, පරසන්ගස්වැව ලිපිනයේ පදිංචිකාරියකි.** මෘත ශරීරය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාරදී ඇත. මැදවච්චිය පොලීසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## මාරක රිය අනතුරක් - තලංගම

04. 2020.03.09 වන දින සවස 3.20 ට පමණ තලංගම පොලිස් වසමේ තලවතුගොඩ හෝකන්දර මාර්ගයේ රෝස්වුඩ් ටෙරස් පෙදෙසෙහිදී තලවතුගොඩ දිශාවට ධාවනයවූ මෝටර් රථයක් දකුණු පස අතුරු මාර්ගයට හැරවීමට යාමේදී ඊට පිටුපසින් පැමිණි තවත් මෝටර් රථයක් ඉහත මෝටර් රථයට ඉස්සර කිරීමට උත්සාහ කර ඇත. එම අවස්ථාවේදී හෝකන්දර දෙසට ධාවනයවූ යතුරු පැදියක් එහි පැදිකරුට පාලනය කරගත නොහැකිව ඉහත මෝටර් රථ දෙකෙහිම මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු ජයවර්ධනපුර රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19ක් වූ මාදිවෙල, කෝට්ටෙ ලිපිනයේ පදිංචිකරුවෙකි.** මෘත ශරීරය ජයවර්ධනපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් මෝටර් රථ දෙකෙහිම රියදුරන් අත්අඩංගුවට ගෙන ඇත. තලංගම පොලීසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## මාරක රිය අනතුරක් - නොරොච්චෝලය

05. 2020.03.09 වන දින උදෑසන 11.30 ට පමණ නොරොච්චෝලය පොලිස් වසමේ නාරක්කල්ලිය ලක්විජය බලාගාරය මාර්ගයේ කතෝලික දේවස්ථානය අසලදී නාරක්කල්ලිය දිශාවට ධාවනයවූ යතුරු පැදියක් පදික පුද්ගලයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා පුත්තලම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 73ක් වූ නාරක්කල්ලිය, නොරොච්චෝලය ලිපිනයේ පදිංචිකරුවෙකි.** මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් යතුරු පැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. නොරොච්චෝලය පොලීසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## හදිසි ගින්නක් - කිරිබත්ගොඩ

06. 2020.03.09 වන දින දහවල් 12.30 ට පමණ කිරිබත්ගොඩ පොලිස් වසමේ නුවර පාර, කිරිබත්ගොඩ ලිපිනයේ පිහිටි නිවසක **හදිසි ගින්නක්** හටගෙන ඇති බවට කිරිබත්ගොඩ පොලිසියට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මකවූ පොලීසිය, කොළඹ මහ නගර සභා ගිනි නිවන ඒකකයේ නිලධාරීන්ගේ සහාය ඇතිව ගින්න මැඩපවත්වා ඇත.

ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර, ජීවිත හානි සිදුව නොමැත. සිදුවූ අලාභය මෙතෙක් තක්සේරු කර නොමැත. පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 01.**